මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசிய கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION & NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01, இலங்கை.
The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk

දිනය / திகதி / Date: 2023 – 01- 02

**නූපන් පරපුර වෙනුවෙන් රාජ්‍ය නිලධාරීන් ලෙස**
**අපේ දායකත්වය දෙගුණ කරමු.**
**අද දවසේ වේදනාත්මක තීරණ**
**යහපත් අනාගත පරපුරකට මං විවර කරනු ඇත.**
**රටට හිමි වූයේ දශක ගණනක දුර්වල මූල්‍ය විනයේ ප්‍රතිඵලයි.**
**- මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා**
**2023 වසරේ රාජකාරි අරඹමින් පවසයි.**

නූපන් පරපුර වෙනුවෙන් අනාගතය සුරක්ෂිත කිරීම සඳහා සිය දායකත්වය දෙගුණ කිරීමට ආරාධනා කරන බවත්, අද දවසේ ගන්නා වේදනාත්මක තීන්දු යහපත් අනාගත පරපුරක් නිර්මාණය කරනු ඇති බවත් මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා 2023 වසරේ රාජකාරි ආරම්භ කරමින් සඳහන් කරයි. හෙතෙම පෙන්වා දෙන්නේ ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ක්‍රියාත්මක කිරීමේ දී දශක ගණනාවක් තිස්සේ පැවැති අඩුලුහුඩුකම්වල ප්‍රතිඵල අද රට පත්ව ඇති තත්ත්වයට හේතුව බවයි. මූල්‍ය විනයක් නොමැතිකම මෙම තත්ත්වයන්ට ප්‍රධාන හේතුව බව පෙන්වා දුන් සිරිවර්ධන මහතා කියා සිටියේ 2023 වසරේ දී සිය දායකත්වය දෙගුණකින් ලබා දෙන ලෙස රටේ හදවත බඳු මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටින බවයි.

2023 වසරේ රාජකාරි කටයුතු ආරම්භ කරමින් රාජ්‍ය සේවක ප්‍රතිඥාව ලබා දීම අද (02) පෙරවරුවේ මුදල් අමාත්‍යාංශ පරිශ්‍රයේ දී සිදු කෙරිණි. මෙම අවස්ථාවට ගරු මුදල් රාජ්‍ය අමාත්‍යවරුන් වන ආචාර්ය රංජිත් සියඹලාපිටිය සහ ෂෙහාන් සේමසිංහ යන මහත්වරු සේම අමාත්‍යාංශයේ සියලු සේවයක සේවිකාවෝ සහභාගී වූහ.

එම අවස්ථාව අමතමින් මුදල් අමාත්‍යාංශ ලේකම් මහින්ද සිරිවර්ධන මහතා මෙසේ ද පැවැසීය.

"රාජ්‍ය සේවකයන් වන අපට මේ අවස්ථාව ඉතාමත් තීරණාත්මක සංධිස්ථානයක්. 2022 වර්ෂය ඉතා සංකීර්ණ, ඉතා ගැඹුරු, ආර්ථික අර්බුදයක් මේ රට තුළ ඇති කළ වර්ෂයක්. ඒක වර්ෂයක හෝ දෙකක ඇති වෙච්ච තත්ත්වයක් විදියට ගන්නවට වඩා මම කැමැතියි අපේ රටේ දශක ගණනාවක් තිස්සේ විශේෂයෙන් ම

ප්‍රතිපත්ති සම්පාදනයේ සහ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ තිබුණ අඩුලුහුඩුකම් තුළින් මතු වෙලා පහුගිය අවුරුදු දෙක හෝ තුන ඇතුළත වඩාත් තීව්‍ර වුණ අර්බුදයක් කියල නිර්වචනය කරන්න.

මම විශ්වාස කරන විදියට මේ අද ඇති වෙලා තියෙන ආර්ථික අර්බුදයට ප්‍රධානතම හේතුව දුර්වල රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය කියල කියන්න බිය විය යුතු නෑ. මම හැම තැන ම කියල තියෙනවා, කැබිනට් මණ්ඩලයටත් කියල තියෙනවා රාජ්‍ය මූල්‍ය අංශයේ දුර්වලතාව නිසා තමයි රට මේ තත්ත්වයකට ඇවිල්ල තියෙන්නෙ කියල. අපි හැම දාම අඩුවෙන් ආදායම අරගෙන වැඩියෙන් වියදම් කළා. අපි කවුරුත් හිතුවෙ නෑ අපට වියදම් කරන්න පුළුවන් ප්‍රමාණය කොච්චර ද අපි මේකට මූල්‍ය ශික්ෂණයක් හදා ගන්න ඕනෙ නේද කියල. මූල්‍ය විනයක් නොමැතිකම තමයි මේ තිබෙන ප්‍රශ්නයට ප්‍රධාන හේතුව. නමුත් ඒක විතරක් කියල මම කියන්නෙ නෑ. අපි ගෙදරක ආර්ථිකයක් ගත්තොත් අපට වියදම වැඩි නම් අපි වියදම අඩු කර ගන්න ඕනෙ. ආදායම අඩු නම් ආදයම් වැඩි කර ගන්න ඕනෙ. අපට ණය ගන්න බැරි නම් අපි තියෙන ප්‍රමාණය කළමනාකරණය කර ගන්න ඕනෙ. ඒ ශික්ෂණය අපි හදා ගන්න ඕනෙ. ගෙදර ආර්ථිකයට වගේම රටේ ආර්ථිකයටත් ඒක පොදුයි.

කුමන හෝ හේතුවක් නිසා අපි දැන් මේ අර්බුදයට මුහුණ දීල ඉන්නෙ. ඒක ආර්ථික අර්බුදයක් විදියට ඇවිල්ල, සමාජ අර්බුදයක් දක්වා ගිහින් දේශපාලන අර්බුදයක් වෙලා අවසානයේ මුළු රාජ්‍ය තන්ත්‍රයම පරිපාලන වෙනසක් දක්වා ගියා. අපි තාමත් ඉන්නෙ ඉතාම ගැඹුරු තත්ත්වයක. අපි ජනතාවට ඉන්ධන දෙනව වෙන්න පුළුවන්. ගෑස් දෙනව වෙන්න පුළුවන්, පෝලිම් නැති වුණා වෙන්න පුළුවන් වුණත් අපි රාජ්‍ය මූල්‍ය පැත්තෙන් බලද්දි ඉතාම ගැඹුරු තැනක ඉන්නෙ. ඒ නිසා අපි 2022 වසරේ දී ගත්ත ප්‍රතිපත්ති, විශේෂයෙන් ම මැයි මාසෙ ගත්ත බදු ප්‍රතිපත්ති තීන්දු, අගෝස්තු මාසෙ කරපු වෙනස්කම් අපි ක්‍රියාත්මක කළ යුතුයි. 2023 වසර සඳහා වූ අයවැය තුළින් ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා මුදල් අමාත්‍යවරයා විදියට ඉදිරිපත් කළේ රටට අලුත් දැක්මක්. සමහර විට ඒව ජනප්‍රිය තීරණ නොවෙන්න පුළුවන්. එතුමා ප්‍රකාශ කළේ ඒව ජනප්‍රිය තීරණ නොවුණත් ඒවා නොගැනීමේ තීරණ තමයි අපි භුක්ති විඳින්නෙ කියල. ජනප්‍රිය නොවුණත් හරි තීරණ අරගෙන ඉදිරියට යන්න ඕනෙ කියන එක තමයි එතුමාගේ දර්ශනය.

අපි දන්නව පසුගිය කාලෙට වඩා අපි දැන් ගන්න තීරණ වෙනස් වෙලා තියෙනවා. සමහර දේවල් දැඩි තීරණ වෙලා යනවා. ඒව ජනප්‍රිය නොවෙන්න පුළුවන්. මුදල් අමාත්‍යාංශය විදියට නෙවෙයි රටක් විදියට ගත්තත් අපි යම් ප්‍රමාණය කැප කිරීමක් කරනව නම් ඒ මත තමයි අනාගතය තීරණය වෙන්නෙ. අද අපි මේ තීරණ නොගෙන හිටියොත් අපට ඉදිරියට යන්න හැකි වෙයි ද කියන ගැටලුව මතු වෙනවා. අද මෙතන ඉන්න පිරිස නෙවෙයි අපේ දරුවො ඉන්නවා, නූපන් පරපුරක් ඉන්නවා. ඔවුන්ට රටක් ඉතුරු විය යුතු යි. ඒ වගකීම මේ මොහොතේ රැඳල තියෙන්නෙ රටේ හදවත වගේ තියෙන මුදල් අමාත්‍යාංශයේ ඉන්න සේවක සේවිකාවන් අතේ කියන

එකයි මගේ අදහස. ඒ නිසා 2023 වර්ෂයේ රාජකාරී ආරම්භ කරන මොහොතේ ඔබතුමාලගේ හදවත්වල මම මේ කාරණාව ලියවන්න කැමැතියි. මුදල් අමාත්‍යාංශ නිලධාරීන් විදියට අපේ උරමත ඉතිහාසයේ නොවූ විරූ වගකීමක් පැවරිලා තියෙනවා.

ගරු ජනාධිපතිතුමා, මහබැංකුව සහ රාජ්‍ය මූල්‍ය අංශය පිළිබඳ තීන්දු තීරණ ගත හැකි පාර්ශ්ව ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම අප සතුයි. අපට කරන්න තියෙන්නෙ නොදන්න දේවල් නෙවෙයි. අපි මේ ප්‍රතිපත්ති දන්නවා, දශක ගණනාවක් කතා කරල තියෙනවා. මගේ අදහසේ හැටියට මේව නිසි පරිදි ක්‍රියාත්මක නොවූ නිසා තමයි රටට මේ වගේ තත්ත්වයකට මුහුණ දෙන්න සිදු වෙලා තියෙන්නෙ. මම කැමැති අඩුවෙන් කතා කරල වැඩියෙන් වැඩ කරන්න. ඒ නිසා අපට පුළුවන් නම් මේ 2023 අවුරුද්දෙදි අපි හැම කෙනෙකුගෙන් ම ඉල්ලා සිටිනවා සිය දායකත්වය දෙගුණ කරන්න කියල. ඒක මේ අවස්ථාවෙ විශාල කැපකිරීමක්. වේදනාකාරී තීරණ මගින් අවුරුද්දක් දෙකක් ඇතුළත අවුරුද්දක් දෙකක් ඉදිරියට ගිහින් එතනින් එහාට පුළුවන් රටක් විදියට ඉස්සරහට යන්න සහ අපි බලාපොරොත්තු වූ වේදනාකාරී නොවන මට්ටමකට ගමන් කරන්න.” යැයි මහින්ද සිරිවර්ධන මහතා වැඩි දුරටත් පැවැසීය.

- මාධ්‍ය ඒකකය